# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2015

## (AA14) ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම

(Business Law and Ethics)

---

ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් පිළිතුරු සැපයීමේදී තරමක පසුබෑමක් දක්නට ලැබුණි. එසේ වීමට හේතු වශයෙන් උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයට ලක් වූ ඇතැම් දුර්වලතා පහත පරිදි විය:

## A - කොටස

**ප්‍රශ්න අංක 01** - ලකුණු 40

මෙම ප්‍රශ්නය සකස් කර ඇත්තේ සමස්ථ විෂය නිර්දේශය හා ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම විෂයට සම්බන්ධ ප්‍රායෝගික දැනුම ආවරණය වන ආකාරයට වේ. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රශ්නයෙහි මුළු ලකුණු සංඛ්‍යාවෙන් අඩකට වඩා ලබා ගැනීමට සමත්ව තිබුණි.

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න පත්‍රයේ ලබා දී ඇති උපදෙස් අවධානයෙන් යුතුව කියවා පැහැදිලිව අවබෝධ කරගෙන පිළිතුරු සැපයීමට සමහර අයදුම්කරුවන් කටයුතු කර නොතිබුණි. පිළිතුරට අදාල අංකය වෙනුවට පිළිතුර ලියා තිබීමත්, සමහර අවස්ථාවලදී පිළිතුර සහ පිළිතුරු අංකය යන දෙක මාරුවෙන් මාරුවට ලියා තිබීමත්, ප්‍රශ්න පත්‍රයේ දක්වා නොමැති රෝමන් ඉලක්කම් වලින් පිළිතුරු ලියා තිබීමත් මගින් ඒ බව දැකිය හැකි විය.

ප්‍රශ්න අංක 1.15 සිට 1.18 දක්වා දී ඇති ප්‍රශ්න වලට කෙටි නිශ්චිත උත්තර බලාපොරොත්තු වූ අතර සමහර අයදුම්කරුවන් දීර්ඝ ලෙස විස්තර දක්වමින් අනවශ්‍ය ලෙස කාලය මිඩංගු කර තිබීම දැකිය හැකි විය.

සමස්ථයක් ලෙස මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව මුහුණ දී තිබූ අතර වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න වලදී නිසි පරිදි දී ඇති උපදෙස් පිළිපැදීම සහ කාලය කළමනාකරණය කර ගැනීමේ වැදගත්කම අවධාරණය කළ යුතුය.

## B කොටස

මෙම කොටස ලකුණු 8 ක් සහිත අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත විය.

**ප්‍රශ්න අංක 02** - ලකුණු 08

මෙම ප්‍රශ්නය නියෝජ්‍යත්ව නීතිය ඇසුරෙන් සකස්කර තිබූ අතර පසුව අනුමත කිරීම මත නියෝජ්‍යත්වය ඇතිවීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා 4 ක් පැහැදිලි කිරීම අපේක්ෂා කර තිබුණි. මෙම ප්‍රශ්නයට ඉතාමත් හොඳින් පිළිතුරු සැපයූ අයදුම්කරුවන් සිටි අතර සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයෙන් අසා තිබූ පිළිතුරු පිළිබඳව අනවබෝධයෙන් කරුණු ඉදිරිපත් කිරීම දක්නට ලැබුණි.

උදා: පසුව අනුමත කිරීම මත (අපරානුමැතියෙන්) නියෝජ්‍යත්වය ඇතිවීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා වෙනුවට අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය පැන නැගීමට සනාථ කළ යුතු සාධක දක්වා තිබුණි. තවද පසුව අනුමත කිරීම මත නියෝජ්‍යත්වය ඇතිවීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා 4 ක් පැහැදිලි කිරීම බලාපොරොත්තු වුවද සමහර අයදුම්කරුවන් අවශ්‍යතා 02 ක් හෝ 03 ක් දක්වා තිබීම ද අවශ්‍යතා 4 ක් දැක්වීම වෙනුවට එකම කරුණ දීර්ඝ වශයෙන් විස්තර කිරීම ද අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට හේතු වී තිබුණි.

## ප්‍රශ්න අංක **03** - ලකුණු 08

මෙම ප්‍රශ්නය සමාගම් නීතිය ඇසුරින් සකසා තිබූ අතර (a) කොටසින් වගකීම් සීමාසහිත සමාගමක වාසි 3 ක් විමසා තිබුණු අතර (b) කොටසින් සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රධාන අන්තර්ගතයන් 2 ක් සඳහන් කිරීම අපේක්ෂා කරන ලදී. සමාගම් නීතිය සහ ජනප්‍රිය ව්‍යාපාරික ආකෘතියක් වන සමාගම් පිළිබඳ ප්‍රායෝගික දැනුම පිරික්සීම අරමුණු කරගත් ප්‍රශ්නයක් ලෙස මෙය දැක්විය හැක. බහුතරයක් අයදුම්කරුවන් විසින් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

## ප්‍රශ්න අංක **04** - ලකුණු 08

මෙම ප්‍රශ්නය ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර ඇසුරෙන් සකසා තිබූ අතර යථා කාලයේ දරන්නෙකු (holder in due course) වීමට සපුරාලිය යුතු අවශ්‍යතා 4 ක් පැහැදිලි කිරීම අපේක්ෂිතය. බහුතරයක් අයදුම්කරුවන් ප්‍රශ්නය පිළිබඳ නිශ්චිත අවබෝධයකින් තොරව පිළිතුරු ලියා තිබූ බවක් පෙනුණි. තවද අවශ්‍යතා හතර වෙනුවට අඩුසංඛ්‍යාවක් දැක්වීම, එකම කරුණ විවිධාකාරයෙන් දැක්වීම, එක් කරුණක් හෝ දෙකක් සම්බන්ධයෙන් අනවශ්‍ය ලෙස දීර්ඝව විස්තර කිරීමෙන් කාල කළමනාකරණය කර ගැනීමට නොහැකි වීම පොදුවේ ගත් කළ ලකුණු අඩු සංඛ්‍යාවක් හිමි වීමට බලපා තිබුණි.

## ප්‍රශ්න අංක **05** - ලකුණු 08

ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය යටතේ සේවක අර්ථසාධක අරමුදල (Employees' Provident Fund - EPF) සහ යම් යම් අවස්ථාවලදී එහි දායක මුදල් ආපසු ගැනීමට ඇති හැකියාව පිළිබඳව අයදුම්කරුවන් සතු දැනුම මැනීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිතය. මෙහිදී කළ යුතු ක්‍රියාව වශයෙන් දක්වා තිබුණේ "විමසන්න" යන්න වන අතර ඒ තුළින් අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ. උදාහරණ ලෙස (a) සහ (d) කොටසේදී *x* යන පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂ භාවය මත දායක මුදල් ලබා ගැනීමට ඇති හිමිකම අතර වෙනස්කම් පවතී. මෙහිදී *x* පුරුෂයෙකු නම් මුදල් ආපසු ලබා ගැනීමට ඇති හිමිකම කෙසේද *x* ස්ත්‍රියක නම් ආපසු ලබා ගැනීමට ඇති හිමිකම කෙසේද යන්න දැක්වීම අවශ්‍ය වී තිබුණි. සමහර අයදුම්කරුවන් ඒ පිළිබඳ අවධානය යොමුකිරීමකින් තොරව පිළිතුරු සපයා තිබීම දක්නට ලැබුණි. කෙසේවුවද, බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

# C කොටස

## ප්‍රශ්න අංක **06** - ලකුණු 15

මෙම ප්‍රශ්නය ගිවිසුම් නීතිය ඇසුරින් සකස්කොට තිබූ අතර (a) සහ (b) ලෙස කොටස් දෙකකින් යුක්ත විය. (a) කොටසින් වලංගු ගිවිසුමක අවශ්‍යතා 4 ක් පැහැදිලි කිරීමට විමසා තිබුණි. මෙයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් විය. එහෙත් සමහර අයදුම්කරුවන් ගිවිසුම් නීතිය පිළිබඳ තමා දන්නා සියලුම කරුණු කාල කළමනාකරණයකින් තොරව පිළිතුර ලෙස ලියා තිබීම දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නයෙහි (b) කොටසින් අවස්ථානුකූල ගැටළුවක් ඉදිරිපත් කර තිබුණි. එනම් දෙනලද අවස්ථාව අධ්‍යයනය කර වලංගු ගිවිසුමක් තිබේදැයි විමසීම අපේක්ෂා කර තිබුණි. වයස අවුරුදු 17 ක පිරිමි ළමයෙකු වූ **චාමර** ගුරු පුහුණු විද්‍යාලයක පුහුණුව ලබා පුහුණු කාලය නිමවීමෙන් පසු අවුරුදු 2 ක කාලයක් ආණ්ඩුවේ සේවය කිරීමට ගිවිසුමකට එළඹ තිබුණි. නමුත් පුහුණු කාලය නිමවීමත් සමග **චාමරට** රැකියා අවස්ථාවක් සඳහා දැන් රට හැර යාමට අවශ වී ඇති හෙයින් මෙම අවස්ථාව තුළ වලංගු ගිවිසුමක් තිබේද යන්න විමසා තිබුණි.

මෙහිදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු කිහිපයකි. එනම්:

- **චාමර** වයස අවුරුදු 17 ක් වන නිසා බාලවයස්කරුවකු වන හෙයින් ඔහුට ගිවිසුමට එළඹීමේ හැකියාවක් නැත. එහෙත් මෙම සාමාන්‍ය නීතියට ව්‍යතිරේක තිබේ.
- එනම් ගිවිසුම බාලවයස්කරුගේ යහපත සඳහා නම් හෝ ඔහුගේ අවශ්‍යතා මිලදී ගැනීම සඳහා නම් ගිවිසුම වලංගු සේ සැලකේ.
- මෙම අවස්ථාවේදී ගිවිසුම **චාමරගේ** යහපත සඳහා නිසා එය වලංගු ගිවිසුමක් ලෙස සැලකිය හැකිය.
- එබැවින් **චාමර** ගිවිසුමෙන් බැඳී සිටී. *(නීතිපතිට එරෙහි කොස්තා නඩුවට සමානය)*

නමුත් සමහර අයදුම්කරුවන් චාමර බාල වයස්කරුවකු හෙයින් ගිවිසුමක් ඇතිකර ගැනීමේ හැකියාවක් නොමැති බව දැක්වීමෙන් ලකුණු අහිමි කරගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් චාමර සුළු ආදායම් ලබන පවුලක බැවින් "අවශ්‍යතාවයන් සඳහා වූ ගිවිසුමක්" බවත් එබැවින් මෙම ගිවිසුම කඩ කිරීම නීති විරෝධී නොවන බවත් දක්වා වැරදි ලෙස කරුණු දක්වා තිබුණි. මෙම ප්‍රශ්නයට සමහර අයදුම්කරුවන් සාර්ථක පිළිතුරු ඉදිරිපත් කර හොඳින් ලකුණු ලබා ගෙන තිබූ අතර තවත් සමහරු විවිධ වූ වැරදි තර්කයන් ඉදිරිපත් කරමින් බොහෝ දුර්වල පිළිතුරු සපයා තිබීම දක්නට ලැබුණි.

## ප්‍රශ්න අංක 07 - ලකුණු 15

භාණ්ඩ විකිණීමේ නීතිය ඇසුරින් සකස් වී තිබූ මෙම ප්‍රශ්නයද (a) සහ (b) වශයෙන් කොටස් දෙකකින් යුක්ත විය.

(a) සාමාන්‍ය නියමයක් වශයෙන් විකුණුම්කරුට තිබූ හිමිකමට වඩා හොඳ හිමිකමක් ගැනුම්කරු අත්පත් කර නොගනී යන නියමයට ඇති ව්‍යතිරේක 4 ක් පැහැදිලි කිරීම මෙම කොටසින් අපේක්ෂා කෙරුණි. මෙම ප්‍රශ්නයට බොහොමයක් අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. සමහරක් අයදුම්කරුවන් මෙම නියමය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැතිව අදාල නැති කරුණු ඉදිරිපත් කිරීම නිසා ලකුණු අහිමි කරගෙන තිබුණි.

(b) මෙම කොටසින් විමසා තිබුණේ දී ඇති අවස්ථාව පිළිබඳ සැලකිලිමත්ව නිමි ඇඳුම් වෙළෙඳසැලට එරෙහිව පැමිණිලි කර වන්දි ඉල්ලා සිටීමට ශෙහාන්ට හිමිකමක් තිබේදැයි විමසීමය. මෙහිදී භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ අදාල ප්‍රතිපාදනයන්ට අවධානය යොමු කරමින් නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතාමත් සුළු පිරිසකි. මෙහිදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු වූයේ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ප්‍රතිපාදන අනුව, භාණ්ඩ අවශ්‍යතාවය සඳහා සුදුසු තත්ත්වයෙන් තිබිය යුතු යැයි පවතින ව්‍යංග කොන්දේසිය හෝ භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ, විස්තර කර තිබෙන ආකාරයට භාණ්ඩ විස්තරයට අනුරූපී විය යුතු යැයි පවතින ව්‍යංග කොන්දේසියයි. නමුත්, සමහර අයදුම්කරුවන් ඒ පිළිබඳව අවධානය යොමු නොකිරීමෙන් විවිධ වූ වැරදි තර්කයන් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් නිවැරදි පිළිතුරු සැපයීමට බෙහෝ අයදුම්කරුවන් අසමත් වූ අතර මෙම කරුණ සම්බන්ධයෙන් ඔවුන්ගේ නොදැනුවත්කම දී ඇති වැරදි පිළිතුරු වලින් මනාව පැහැදිලි විය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්නය තුළ භාවිත කර ඇති **<u>කළ යුතු ක්‍රියාව</u>** තුළින් බලාපොරොත්තු වන පිළිතුර ක්‍රියා නිර්වචනයට අනුකූල වන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

4. මෙම විෂයට අදාළ ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -